## විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය

# ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව

# පුරප්පාඩු

1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ වැඩිදියුණු කිරීමේ පනත යටතේ ස්ථාපනය කරනු ලැබූ ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික වෘත්තිකයින්ගෙන් පහත තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

## මූල්‍ය නිලධාරී තනතුර (JM 1-2) - 01

**සුදුසුකම් :**

**බාහිර අපේක්ෂකයින් සඳහා (පහත සඳහන් 1 හෝ 2) :**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිලිගත් මූල්‍ය, වාණිජ, ගිණුම්කරණය, මූල්‍ය කලමනාකරණය, ව්‍යාපාර කලමනාකරණය සම්බන්ධ මූලික උපාධියක් ලබා තිබීම.
02. තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයකින් පිලිගත් වෘත්තිය වරලත් ආයතනයක අන්තර් මධ්‍ය විභාගය සමත් වීම.

අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා (පහත සඳහන් 1 හෝ 2)

01. ඉහත සඳහන් බාහිර අපේක්ෂකයන් සඳහා නියමිත සුදුසුකම් ලබා තිබිය යුතුය.
02. තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයේ "**කලමනාකරණ සහකාර – තාක්ෂණික නොවන**" (MA 1-2) II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

**වයස** : අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහල වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප** : JM 1-2-2025 Rs. (74,010 - 10 x 1,360 - 18 x 2,040 - 124,330)

(මූලික වැටුප + රජය විසින් අනුමත අනෙකුත් දීමනා)

**තනතුරට අදාළ ප්‍රධාන රාජකාරී** : වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර පිවිසෙන්න : http://www.nastec.gov.lk

**බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය** : පත්කිරීමේ බලධාරියා විසින් පත් කරන ලද මණ්ඩලයක් මගින් පවත්වනු ලබන තරගකාරී ලිඛිත විභාගයක සහ / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

**ඉල්ලුම්පත් සඳහා ක්‍රමවේදය :**

- අයදුම්පත් වෙබ් අඩවියේ දක්වා ඇති පරිදි යොමු කිරීමට අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටී. https://forms.gle/AsDh5JUejwGTc9dPA මෙම අවශ්‍යතාව තහවුරු නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

  සහ

- ජීව දත්ත තොරතුරු ඇතුලත් අදුම්පත්‍රය සහ සහතික කරන ලද අදාල සහතික පත්‍රවල පිටපත් සමග ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ සම්බන්ධ කරගත හැකි තොරතුරු සහිතව **අධ්‍යක්ෂ / ප්‍ර.වි.නි., ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව, 06 වන මහල – D පර්යන්තය, දෙවන අදියර, සෙත්සිරිපාය, බත්තරමුල්ල** යන ලිපිනයට 2026.06.25 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. තෝරාගනු ලැබූ අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ලිපි කවරයේ වම්පස ඉහල කෙලවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කල යුතුය.

  රජයේ සංස්ථා / මණ්ඩල / රාජ්‍ය අංශයේ සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ ආයතන ප්‍රධානීන් හරහා යොමු කල යුතුය.

- මෙම ස්ථිර තනතුරට සේවක අර්ථසාධක අරමුදල (ආයතනික දායකත්වය 12% සේවක දායකත්වය 8%) සහ සේවක භාර අරමුදල (ආයතනික දායකත්වය 3%) සඳහා හිමිකම් ඇත.

**අධ්‍යක්ෂ /ප්‍ර.වි.නි.**
**ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව,**
**06 වන මහල - D පර්යන්තය,**
**දෙවන අදියර, සෙත්සිරිපාය, බත්තරමුල්ල.**
**Tel : +94112186711, Fax : +94112186713**